*සැ. යු.-* 2020.06.19 දින පළ වූ අංක 2,181 දරන *ගැසට් පත්‍රයේ* II සහ III කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,182 - 2020 ජූනි මස 26 වැනි සිකුරාදා - 2020.06.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 556 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 ජූලි මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජූලි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

(කොළඹ පැවැත්වෙන) බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය

හැටන් නැෂනල් බැන්ක් ලිමිටඩ් යනුවෙන් කලින් හැඳින්වුණු හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී,
අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

නඩු අංකය : CHC 28/17/MR.
ඇස්කීසි අංකය : 16/2020
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 14,000,000

*සහ*

ශාඛා කාර්යාලයක් කොළඹ 10, මාලිගාවත්ත මහලේකම් කාර්යාලයේ පවත්වාගෙන යනු ලැබේ.

*........................පැමිණිලිකරු..*

*එදිරිව*

1. මුසින් මොහොමඩ් අබ්දුල්ලා
2. ජෙනුදීන් මොහොමඩ් ෂර්ෆාස්
3. මොහ්මුඩ් තරීක් මොහොමඩ්
   සියල්ලන්ම කොළඹ 09, දෙමටගොඩ පාර, අංක 252/7 දරන ස්ථානයේ නයින් ස්ටාර්ස් යන නාමය විලාසය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරය කරගෙන යනු ලැබේ.
4. හමීඩ් බුහාරී ෆව්සුල් හිනායා *නොහොත්* ෆවසිල් හිනායා අංක 17, පුවිලිංගම් පෙදෙස, කොළඹ 08.

*........................විත්තිකරුවන්.*

ඉහත අංක සඳහන් නඩුවෙන් මා හට නිකුත් කරන ලද විකිණීමේ අධිකාරී පත්‍රයට අනුව පැමිණිලිකාර බැංකුවට ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් පවත්වා ගෙන යනු ලබන නයින් ස්ටාර්ස් යන නමින් ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යන මුසින් මොහොමඩ් අබ්දුල්ලා, ජෙනුදීන් මොහොමඩ් ෂර්ෆාස්, මොහ්මුඩ් තරීක් මොහොමඩ්, හමීඩ් බුහාරී ෆව්සුල් හිනායා යන අයවලුන් විසින් පැමිණිලිකාර බැංකුවට සමථ තීන්දු ප්‍රකාශය අනුව ගෙවිය යුතු බවට තීරණය කර ඇති රු. 9,613,868.92 ක් මුදල සහ ඒ සඳහා 2016 ජනවාරි මස 01 වැනි දින පටන් තීන්දු ප්‍රකාශිත මුළු මුදල සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන තෙක් ඒ සඳහා වර්ෂයකට 12% බැගින් පොළිය ද, රු. 3,422,958.91 ක් මුදල ඒ සඳහා 2016 ජනවාරි 01 වැනි දින පටන් තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා සහ එතැන් සිට තීන්දු ප්‍රකාශිත මුලු මුදල සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන තෙක් ඒ සඳහා වර්ෂයකට 12% බැගින් පොළිය ද සහ රු. 933,879.46 ක් වූ මුදල සහ ඒ සඳහා 2016 ජනවාරි 01 වැනි දින පටන් තීන්දු ප්‍රකාශයේ දින දක්වා සහ එතැන් සිට තීන්දු ප්‍රකාශිත මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ සඳහා වර්ෂයකට 12% බැගින් පොළිය ද ගෙවිය පැහැර ඇති හෙයින් පහත උපලේඛනයේ විස්තර දේපල, වර්ෂ 2020 ක් වූ ජූලි මස 30 වැනි දින ප.ව. 2.30 ට විත්තිකරුවන්ගේ දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර වෙන්දේසි අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැණුම් මිලෙන් සියයට විසි පහක් (25%) මුදලක් ද පිස්කල් ගාස්තු රජයට අය විය යුතු ගාස්තු තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට්* පත්‍රයේ සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් එවෙලේම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාර ගනු නොලැබේ. ගැණුම් මිලෙන් සියයට හැත්තෑ පහක් (75%) ඉතිරි මුදල දින 30 ක් ඇතුලත කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

*දේපල පිහිටි ස්ථානය ප්‍රවේශවන මාර්ගය.-* බොරැල්ල මංසන්දියේ සිට මරදාන පාරේ ඉදිරියෙන් දකුණු පස මහජන බැංකු ගොඩනැගිල්ල යාබද ඇති පුවලිංගම් පෙදෙස පාරේ මීටර් කීපයක් ඉදිරියට ගිය පසු වම්පස වරිපනම් අංක 17 දරන නිවස පිහිටා ඇත.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සීමාවේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ බොරැල්ල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වසම් අංක 35 දරන බොරැල්ල දකුණ පිහිටි පුවිලිංගම් පෙදෙසේ වරිපනම් අංක 17 දරන බලයලත් මිනින්දෝරු ඒ. එෆ් සමීර් විසින් 1972.11.15 දින පිළියෙල කරන ලද අංක 1469 දරන පිඹුරේ බෙදා වෙන්කල ලොට් ඒ 10 දරන ඉඩම්

කොටස වන උතුරට : ලොට් ඒ 13 න් ද, නැගෙනහිරට : ලොට් ඒ 13 න් ද දකුණට : පුවිලිංගම් පෙදෙසෙන් (ලොට් ඒ 25) ද සහ බස්නාහිරට : ලොට් ඒ 9 න් ද මායිම් වූ එකී අංක 1469 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දෙකයි දශම දෙකයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 2.20) ක් විශාලත්වයෙන් යුක්ත ඉඩම් කොටස සහ ඒ තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලුදේත් සමගවන මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 74/102 දරන පත්‍රිකාවේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 5264 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති මාර්ග අයිතීන් ද සහ අනෙකුත් පොදු පහසුකම් ද සමග ද වේ.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2020 ක් වූ ජුනි මස 08 වැනි දින දී ය.

06-225

---

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

### තංගල්ල දිසා අධිකරණයේ දී ය

තංගල්ල, කෙලින් වීදියේ, අංක 90 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් සහ කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී,

නඩු අංකය : එම්. බී. 10983/14.
ස්වභාවය : උකස්
ක්‍රියාපටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 5,100,000

*..............................පැමිණිලිකරු.*

*එදිරිව*

1. අබේදීර ගුණරත්න පටබැඳිගේ නිමල් කුමාර, අංක 272/1, තිස්ස පාර, තංගල්ල.
2. අබේදීර ගුණරත්න පටබැඳිගේ නාමලී ද සිල්වා, අංක 272/1, තිස්ස පාර, තංගල්ල.

*.............................විත්තිකරුවන්.*

ඉහත සඳහන් නඩුවේ වර්ෂ 2015 ක් වූ ඔක්තෝබර් මස 06 වන දින දී ඇති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව, එකී නඩුවේ 1 සහ 2 වන විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුව වෙත ගෙවිය යුතුව ඇති රු. 4, 314,258.28 ක මුදල මත 2014.06.01 වන දින සිට තීන්දු ප්‍රකාශයේ දින වනතෙක් ඒ සඳහා වර්ෂයකට 13.75% බැගින් පොලිය සහ තීන්දු ප්‍රකාශයේ දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ සඳහා නෛතික පොලියද සහ රු. 707,851.52 ක මුදල 2014.06.01 වන දින සිට තීන්දු ප්‍රකාශයේ දින වනතෙක් ඒ සඳහා වසරකට 19% බැගින් වූ පොලිය සහ තින්දු ප්‍රකාශයේ දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ සඳහා නෛතික පොලියද, නඩු ගාස්තු ද අයකර ගන්නා ලෙස අණ කර තීන්දු ප්‍රකාශ කර ඇත. ඒ අනුව එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාවේ බලයපිට මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ, වර්ෂ 2020 ක් වූ අගෝස්තු මස 25 වන දින, පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට, දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, තංගල්ල නගර සභා බල සීමාව තුළ, හම්බන්තොට පාරේ පිහිටි ''ජයවීරගේ හේන *නොහොත්* ජයිරගේහේන'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. වර්ණකුලසූරිය සකස් කරන ලද 1995.01.12 වන දින හා අංක 1541 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 10 නමැති ඉඩමට මායිම් : උතුරට මෙම පිඹුරේ කැබලි අංක 01 සහ 02 ද, නැගෙනහිරට මෙම පිඹුරේ කැබලි අංක 04 සහ 05 (මාර්ග අයිතිය) සහ කැබලි අංක 9 ද, දකුණට : නිවාසවල සිට ප්‍රධාන පාර දක්වා දිවෙන පාර ද සහ බස්නාහිරට : මෙම ඉඩමේ කොටසක් ද යන මායිම් තුළ වූ පර්චස් දොළහයි දශම හතර (අක්. 0, රූ. 0, පර්. 12.4) ක් විශාල ඉඩම සහ වරිපනම් අංක 274 (268) ගොඩනැගිලි සහ ඒ තුළ ඇති ගහකොළ පළතුරු ආදී ඊට අයත් සියලුම දේ සමඟ වේ. මෙය තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක F206/95 යටතේ ලියාපදිංචි කර ඇත.

*දේපළ පිහිටි ස්ථානයට ප්‍රවේශ වන මාර්ගය.-* මෙම දේපළ තංගල්ල නගරය පසුකර හම්බන්තොට ප්‍රධාන පාරේ මීටර් 800 ක් පමණ ගමන් කල විට දකුණු පසින් හමුවන ගුරු පාරේ මීටර් කිහිපයක් ගමන් කළවිට වම්පසින් පිහිටා ඇති අතර, එම ස්ථානය තංගල්ල හම්බන්තොට පාරේ වරිපනම් අංක 272/1 යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිළෙන් සියයට විසිපහ 25% ක මුදලක් ද, සි.න. වි. සංග්‍රහයේ අංක 258 ප්‍රකාර පිස්කල් විසින් අයකරනු ලබන රජයේ ගාස්තුද, පළාත් පාලන ආයතන ගාස්තු ලෙස සියයට එක 1% ක මුදලක්ද, වෙන්දේසිය සඳහා වූ සියලුම වියදම් ද එවෙලේම ගෙවිය යුතුය.

තව ද, ගැණුම්කරු විසින් ඉතිරි සියයට හැත්තෑ පහ 75% ක් වූ මුදල දින 30 ක් ඇතුළත එකී නඩුවේ බැරට එකී අධිකරණයේ තැන්පත් කළයුතු වන අතර, ඒ සඳහා පිළිගත හැකි ඇපකරුවන් දෙදෙනෙකු එම අවස්ථාවේදීම ඉදිරිපත් කරමින් විකුණුම් කොන්දේසි අත්සන් තැබිය යුතුය.

කේ. ඒ. ඩී. එස්. කුමාරපේලි. (සා.වි).
අධිකරණ රෙජිස්ට්‍රාර්,/නියෝජ්‍ය පිස්කල්.
ප්‍රොබේට් නිලධාරි.

වර්ෂ 2020 ක් වූ ජුනි මස 03 වැනි දින දී ය,
තංගල්ල දිසා අධිකරණයේ දී ය.

02-255